ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
අධ්‍යාපනපති උපාධි වැඩසටහන
අවසාන පරීක්ෂණය -2024/2025
**STP9811** - අධ්‍යාපනයේ මනෝවිද්‍යාත්මක පදනම
කාලය - පැය තුන (03) යි.

---

දිනය : 2026.01.24 වේලාව : පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

ඕනෑම ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න.

01. අධ්‍යාපනඥයන් හා අවබෝධ කර ගැනීමට අවශ්‍ය වන මූලික සාධක කිහිපයක් මානව සංවර්ධනයට බලපෑම් ඇති කරයි.

(i.) මානව සංවර්ධනයේ මූලධර්ම තුනක් (03) පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ii.) මානව සංවර්ධනයට බලපාන ප්‍රධාන සාධක දෙකක් (02) නම්කොට පැහැදිලි කරන්න. එම එක් එක් සාධකය මානව සංවර්ධනයට බලපාන ආකාරය සුදුසු උදාහරණ දෙක (02) බැගින් දක්වමින් සාකච්ඡා කරන්න. (ලකුණු 10)

(iii.) පන්ති කාමරයේ සේවය කරන ගුරුවරයෙකුට සංවර්ධන සාධක පිළිබඳ අවබෝධය ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ප්‍රයෝජනවත් වන්නේ කෙසේදැයි උදාහරණ තුනක් (03) සපයමින් පැහැදිලි කරන්න. (ලකුණු 09)

02. විවිධ න්‍යායන් මගින් චිත්තවේගවල ස්වභාවය පැහැදිලි කර ඇත.

(i.) තෝරාගත් මනෝවිද්‍යාත්මක න්‍යායක මූලික සංකල්ප ඇසුරින් චිත්තවේගයන්ගේ ස්වභාවය විවේචනාත්මකව පරීක්ෂා කරන්න. (ලකුණු 06)

(ii.) මැදි සහ පසු ළමාවියේ ප්‍රදර්ශනය කෙරෙන චිත්තවේගීය සංවර්ධනයේ ප්‍රධාන ලක්ෂණ තුනක් (03) පැහැදිලි කරන්න. (ලකුණු 09)

(iii.) චිත්තවේගීය බුද්ධිය (emotional Intelligence) යන සංකල්පය පැහැදිලි කර ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ගුරුවරුන්ට එහි ඇති වැදගත්කම හේතු තුනක් (03) දක්වමින් සාකච්ඡා කරන්න. (ලකුණු 10)

03. (i.) අවධානය යොමු කිරීමේ ආබාධයකින් (attention disorder) පෙළෙන සිසුවෙකුගේ ප්‍රධාන ලක්ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 08)

(ii.) අවධානය යොමු කිරීමේ ආබාධයකින් පෙළෙන සිසුවෙකුට සහාය වීම සඳහා ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ගුරුවරයෙකුට අනුගමනය කළ හැකි උපාය මාර්ග හතරක් (04) යෝජනා කරන්න. (ලකුණු 08)

(iii.) ගුරුවරයෙකුට අන්තර්කරණ අධ්‍යාපන භාවිතයන් අවශ්‍යවන්නේ මන්දැයි හේතු තුනක් (03) දක්වමින් පරීක්ෂා කරන්න. (ලකුණු 09)

04. (i.) 'අධි ප්‍රජානන හැකියාවන්' (meta – cognitive abilities) යන සංකල්පය එහි ප්‍රධාන සංරචක ඉස්මතු කරමින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(ii.) සිසුන්ගේ ඉගෙනීමේ දී, අධි ප්‍රජානනය ප්‍රයෝජනවත් වන්නේ මන්දැයි හේතු **හතරක් (04)** දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii.) ද්විතීයික පාසැල් සිසුන්ගේ අධි ප්‍රජානන හැකියාවන් සංවර්ධනය කිරීම සුසාධ්‍යකරණය සඳහා ගුරුවරුන්ට අනුගමනය කළ හැකි උපාය මාර්ග **තුනක් (03)** සාකච්ඡා කරන්න. (ලකුණු 09)

05. (i.) මානවවාදී න්‍යායයට අදාලව පුද්ගලයෙකුගේ පෞරුෂ සංවර්ධනයට බලපාන සාධක සාකච්ඡා කරන්න. (ලකුණු 07)

(ii.) ශ්‍රී ලංකාවේ පාසැල් සන්දර්භයෙන් උදාහරණ **තුනක් (03)** දක්වමින්, ගුරුවරුන්ට/ දෙමාපියන්ට දරුවන් තුළ හොඳින් සමායෝගී වූ පෞරුෂයන් (well-adjusted personalities) සංවර්ධනය කිරීම අවශ්‍ය වන්නේ මන්දැයි පරීක්ෂා කරන්න. (ලකුණු 09)

(iii.) දරුවන් තුළ හොඳින් සමායෝගී වූ පෞරුෂයන් සංවර්ධනය කිරීමට ගුරුවරයෙකුට ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ ක්‍රියාත්මක කළ හැකි උපාය මාර්ග **තුනක් (03)** පැහැදිලි කරන්න. (ලකුණු 09)

06. (i.) ජෝන් ඩූවිගේ ප්‍රජානන සංස්කරණාත්මක (Cognitive constructivism theory) න්‍යායයේ සහ විගොට්ස්කිගේ සමාජ සංස්කරණාත්මක (Social constructivism) න්‍යායයේ මූලික අදහස් සංසන්දනය කරන්න. (ලකුණු 05)

(ii.) සංස්කරණාත්මක ඉගෙනීමේ (constructivist learning) ප්‍රධාන ලක්ෂණ **හතරක් (04)** සඳහන් කර සිසුවෙකු සඳහා සංස්කරණාත්මක වාදයේ ප්‍රතිලාභ **තුනක් (03)** පැහැදිලි කරන්න. (ලකුණු 10)

(iii.) සිසුන් අතර සංස්කරණාත්මක ඉගෙනුම සුසාධ්‍යයකරණයට ගුරුවරුන්ට ගත හැකි උපායමාර්ග **තුනක් (03)** සහ, එම උපාය මාර්ග ක්‍රියාත්මක කිරීමේ දී ගුරුවරුන්ට මුහුණ දීමට සිදුවිය හැකි අභියෝග **දෙකක් (02)** පැහැදිලි කරන්න. (ලකුණු 10)

-හිමිකම් ඇවිරිණි. -